*සැ. යු.* — 2014.07.25 දින පළ වූ අංක 1,873 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,874 - 2014 අගෝස්තු මස 01 වැනි සිකුරාදා - 2014.08.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 944 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 951 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 957 |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 961 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අගෝස්තු මස 22 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අගෝස්තු මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාතේ රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අදාළ අවම සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න වසර තුනක ස්ථිර පදිංචිය ඇති පදිංචිකරුවන්ට හා දැනටමත්, ස්ථිර, තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හා ව්‍යාපෘති පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියැදුරු II | 01 | රා.පා.ච. 06/2006 iv අනුව PL3- 2006A රු. 12,470 -130 x 10 - 145 x 10 - 160 x 10 - 170 x 10- රු. 18,860 iv වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත්වීම. (එක් වරක දී අවම වශයෙන් විෂයයන් 05 ක් සමත්ව තිබිය යුතු ය.)<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br><br>*(i)* පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර් 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් තිබිය යුතු ය. රජයේ හෝ පිළිගත් ආයතනයක සැහැල්ලු වාහන පැදවීම පිළිබඳ අවම වශයෙන් වසර 03 ක පලපුරුද්දක් තිබීම ;<br><br>*(ii)* දෙපාර්තමේන්තු නියෝජිතයකු, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථවාහන පරීක්ෂක වරයෙකු,පොලිස් රථ වාහන අංශයේ නිලධාරියකුගෙන් ද සමන්විත මණ්ඩලයක් මගින් පවත්වන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයකින් සමත්වීම ; (සහතික මගින් සනාථ කළ යුතු ය)<br><br>*(iii)* අවම උස අඩි 05 ක් විය යුතු ය.<br><br>*(iv)* දිවා කාලයේ දී රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br><br>*(v)* මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය. |
| 02 | කාර්යාල කාර්ය සහයක III | 01 | රු. 13,060 - 130 x 10 - 145 x 10 - - 160 x 12 - රු. 17,600 | අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් එක් වරක දී කවර හෝ විෂයයන් 6 කින් සමත්විය යුතු ය. |

*අවශ්‍ය වෙනත් සුදුසුකම් .*

(i) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය;
(දැනට රජයේ හෝ පළාත් පාලන රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වෙයි)

(ii) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි;

(iii) අයදුම්පත් කැඳවන දිනවන විට අයදුම්කරු බස්නාහිර පළාතේ අවම වශයෙන් වසර 03 ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය;

(iv) දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි අයදුම්කරුවන් වෙනුවෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(v) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය ශරීර තත්ත්වයකින් යුක්ත විය යුතු ය;

(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියෙන් වරදකරුවකු වී දඬුවම් ලැබුවකු නොවිය යුතු ය;

(vii) රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු ය;

(viii) දැනටමත් දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක, දීමනා, කොන්ත්‍රාත් හෝ කුලී පදනම යටතේ සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) එම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය;
(ii) වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට දායක විය යුතුය;
(iii) පත්වීම වසර 03 පරිවාස කාලයකට යටත් වන්නේය;
(iv) මෙම බඳවා ගැනීම් ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද මුදල් රෙගුලාසිවලට ද, රජය හෝ බස්නාහිර පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලය. ඒ අනුව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

(i) විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ;
(ii) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කල යුතු ය ;
උප්පැන්න සහතිකය ;
ජාතික හැඳුනුම්පත ;
අධ්‍යාපන සහතික, ඉහළම අධ්‍යාපනික සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික ;
තම පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය ;
මෑතක දී ලබා ගන්නා ලද චරිත සහතික 02 ක් ;
(එක් චරිත සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මහතාගෙන් ලබා ගත යුතු ය. එය ප්‍රාදේශීය ලේකම් විසින් අනුඅත්සන් කළ යුතු ය) ;
වෘත්තීය පලපුරුද්ද හා වෙනත් සුදුසුකම් දැක්වෙන සහතිකය ;
දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව එවිය යුතු ය.

04. බඳවා ගැනීමේ පටිපාටියට අනුව ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

06. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2014.08.29 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව, දොඩන්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහල කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. තැපෑලේ දී නැති වන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලැබෙන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

එච්. ඒ. සුජන්ත,
ලේකම්,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව - දොඩන්ගොඩ.

2014 ජූලි මස 07 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දොඩන්ගොඩ.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව***

.................................. තනතුර සඳහා අයදුම්පත්‍රය

01.*(අ)* අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————.
මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.

02. තැපැල් ලිපිනය :——————.

03. දුරකථන අංකය :——————.

F2 - B80862

04. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස:
අවුරුදු :————.මාස:————. දින :————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :————.

07. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

08. විවාහක/අවිවාහක :————.

09. ජාතිය :————.

10. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන්ද? යන වග :————.

11. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණා එවන්න) :————.

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් :
(i) දැනට දරන තනතුර :————.
(ii) එම තනතුරට පත් වූ දිනය :————.
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ව්‍යාපෘති පදනම මත ද) :————.

13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————.

ඩමෙම අයදුම්පතේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව, මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

08-140

---

**මහර ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මහර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා බස්නාහිර පළාත තුල පදිංචි සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය (මාසිකව)* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | රු.11,730 - 10 x 120 - 10 - 130 10 x 145 - 12 x 160 -රු.17,600 (PL1-2006A) | 5 වන ශ්‍රේණිය හෝ 6 වසර සමත්ව තිබිය යුතු ය. |
| 02 | රියදුරු | 02 | රු.12,470- 10 x 130 - 10 x 145 10 x 160 - 12 x 170 - රු.18,860 (PL3-2006A) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙ.) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත්වීම (එක් වරක දී අවම වශයෙන් විෂයයන් 05 ක් සමත්ව තිබිය යුතු ය.) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුනතා සහතිකය හා වාහන රියදුරකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතු ය. (සහිතක මගින් සනාථ කළ යුතු ය.) අවම උස අඩි 05 ක් විය යුතු දිවා කාලයේ දී හා රාත්‍රි කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය. |

*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි ඃ*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය ;
(ii) අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය;

(iii) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බලනොපානු ඇත)
(iv) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවකු හෝ රජයේ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුය.
(vi) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස්කම් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මහර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) පත්වීමේ දින සිට අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වේ.
(iii) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලටද, බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මහර ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.
2. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි වල සහතික කළ පිටපත් එවිය යුතුයි.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතිකය
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය
4. මෑතක දී ලබාගත් ග්‍රාමසේවා සහතිකය
5. මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක්
6. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික
7. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස් කර ඉල්ලුම් කරන තනතුර අදාල කවරයේ වම්පස ලියා 2014.08.22 වැනි දිනට පෙර ලේකම්, මහර ප්‍රාදේශීය සභාව, පහළකරගහමුණ, කඩවත යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය) නියමිත දිනෙන් පසු ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්. ඒ. කේ. එන්. ඉන්ද්‍රජිත්,
ලේකම්,
මහර ප්‍රාදේශීය සභාව.

2014 ක් වූ ජූලි මස 16 වැනි දින,
මහර ප්‍රාදේශීය සභාව,
පහළකරගහමුණ,
කඩවත.

ආදර්ශ අයදුම්පත්‍රය

මහර ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ........................................................ තනතුර සඳහා බඳවා ගැනීම

1. මුලකුරු සමග නම :——————————————.
 මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————.
3. ස්ථිර ලිපිනය :——————————————.
4. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.
5. උපන් දිනය :——————————————.

2014.08.22 දිනට වයස අවුරුදු :———.මාස:———. දින :———.

6. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.

7. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද/ලියාපදිංචි වීමෙන්ද? :——————————.

8. (i) අධ්‍යාපන සුදුසුකම්:——————————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1 | | 5 | |
| 2 | | 6 | |
| 3 | | 7 | |
| 4 | | 8 | |

(ii) වෙනත් සුදුසුකම්

9. වෘත්තීයමය සුදුසුකම් :——————————.

10. සේවා පළපුරුද්ද :——————————.

(i) දැනට දරන තනතුර :——————————.

(ii) එම තනතුරට පත්වූ දිනය :——————————.

(iii) එම තනතුරේ සේවා කාලය :——————————.

(iv) මීට පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුරු :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ ව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව මා තෝරා ගැනීමට පෙර හෝ පසුව හෙළිවුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන

දිනය :——————————.

දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන... මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම කාර්යාලයේ........................... වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන
නිලමුද්‍රාව.

දිනය :——————————.

08-221

---

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු**
**බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාතේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ පහත දැක්වෙන තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් ගෙන්, පුරප්පාඩු වී ඇති තනතුරු වලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2014.08.15 වැනි දිනට හෝ එදිනට පෙර"ලේකම්, බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව, පානදුර පාර, බණ්ඩාරගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන් ට සහ මෙම සභාවේ දැනට අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂයෙන් සලකා බලනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | වැටුප් ක්‍රමය | තනතුරු ගණන | අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | රියදුරු II ආ | PL-3- 2006A රු.12,470 - 130 x 10 - 145 x 10 - 160 x 10 - 170 x 12 - රු.18,860 (ආරම්භක පියවර) | 02 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 කින් සමත්වීම (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05 ක් සමත්ව තිබිය යුතුය.)<br><br>පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය.<br><br>වාහන රියදුරකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතු .ය) අවම උස අඩි 05 ක් විය යුතුය. දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. |
| 02 | වැඩ ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | PL-1-2006A රු.11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10- 160 x 12 - රු.17,600 (ආරම්භක පියවර) | 06 | අවම වශයෙන් 8 වෙනි ශ්‍රේණිය/9 වසර සමත් වී තිබිය යුතු ය. |
| 03 | යන්ත්‍ර ක්‍රියාකරු III ශ්‍රේණිය | PL-1-2006A රු.12,210 - 130 x 10 - 145 x 10 - 160 x 10 - 170 x 12- රු.18,600 (ආරම්භක පියවර) | 01 | ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් කුමන හෝ විෂයයන් 02 කින් සමත්වී තිබීම සහ තනතුරට අදාළව වසර දෙකක පළපුරුද්ද ලබා තිබිය යුතුය.<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br>අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වැනි වසර සමත් වී තිබීම සහ තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. |
| 04 | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | PL- 1- 2006A රු.11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 -160 x 12 - රු.17,600 (ආරම්භක පියවර) | 01 | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

ඉහත සඳහන් කරන ලද ඒ ඒ තනතුර සඳහා අදාළ සුදුසුකම්වලට අමතරව පහත දැක්වෙන පොදු සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

*01. පොදු සුදුසුකම් :-*

(i) අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වර්ෂ 03 ක කාලයක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. (බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.). ඡන්ද හිමි නාමලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් සහතික කරනු ලබන ග්‍රාම නිලධාරි සහතිකයකින් සනාථ විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2014.08.15 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

(iii) අයදුම්කරු යහපත්/විශිෂ්ඨ චරියකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

(v) අයදුම්කරු පරම්පරාවෙන් ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(vi) ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 05ක කාලය තුළ වරදකට (අවවාද කිරීමකට හැර) දඬුවමක් ලබා නොමැත්තා වූද සතුටුදායක සේවා කාලයක් සපුරන අයෙකු විය යුතුය.

(vii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින් තනතුරු සඳහා අයදුම් කිරීමේදී, රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල/සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුය.

02. *සේවය නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.

(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන්නේය./ශ්‍රේණිගත උසස්වීමක් නම් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාල සීමාවකට යටත් විය යුතුය.

(iii) ඉහත තනතුරු යටතේ බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(iv) මෙම සේවයේ සේවකයින් ස්ථාන මාරුකිරීම්වලට යටත් වේ. පළාත් පාලන ආයතන තුළ ස්ථාන මාරු කිරීමේ බලය ඒ ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන ප්‍රධානියා සතු වේ. තව ද, පළාත් පාලන ආයතන අතර ස්ථාන මාරු කිරීම් ඒ ඒ පළාත් ආයතනවල ප්‍රධානීන්ගේ එකඟතාවය මත පළාත් පාලන කොමසාරිස් විසින් සිදු කරනු ඇත. රාජකාරි වේලාව හා රාජකාරියේ යෙදවීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ප්‍රධානියාට රජය පිළිගත් නීතිරීතිවලට යටත්ව තීරණය කළ හැකි වේ.

(v) මෙම බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලට ද රජය හෝ පළාත් සභාව හෝ දෙපාර්තමේන්තු නියෝගවලට ද, වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලවය. ඒ අනුව ක්‍රියා කිරීමට පත්වීම්ලාභීන් බැඳී සිටිය යුතුය.

*03. බඳවා ගැනීමේ ක්‍රමය ඃ*

(i) බඳවා ගැනීමේ පරිපාටියට අනුව ලිඛිත/ව්‍යුහගත පරීක්ෂණයක ප්‍රතිඵල මත හෝ අවශ්‍යතාවය අනුව ප්‍රායෝගික පරීක්ෂණයක කුසලතාවය මත සුදුසුකම් ලබන අයව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් සුදුස්සන් තෝරා ගැනේ.

(ii) බඳවා ගැනීමේ පරිපාටීන්ට අනුව ලිඛිත/ව්‍යුහගත පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් නොමැති තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ලකුණු හා සුදුසුකම් මත සුදුස්සන් තෝරා ගැනේ.

04. *අයදුම් කිරීමේ ක්‍රමය ඃ*

(i) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික පත්‍රවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය ඃ-

(1) උප්පැන්න සහතිකය,
(2) ජාතික හැඳුනුම්පතේ පිටපත,
(3) මූලික අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන ලියවිලි,
(4) වෘත්තීය හෝ පළපුරුද්ද සනාථ කෙරෙන ලියවිලි,
(5) තම පදිංචිය සනාථ කිරීම පිණිස මෑතකදී ලබාගත් ග්‍රාම සේවා සහතිකය.

(ii) මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(iii) අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ බඳවා ගැනීමට නියමිත තනතුරු සංඛ්‍යාව සංශෝධනය/තීරණය කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

(iv) රියදුරු තනතුර සඳහා බඳවා ගැනීමේ ක්‍රමයේදී සුදුසුකම් ලද කණිෂ්ඨ සේවකයින් අතුරින් අයදුම්පත් කැඳවා ඔවුන් ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර ඉන් සමත් වූවන් තේරීම් කර බඳවා ගැනීම හෝ අංක 24/95 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ දැක්වෙන උපදෙස්වලට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂකවරයෙකු, පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකුගේ හා දෙපාර්තමේන්තු නිලධාරියෙකුගෙන්ද සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුනතා මැනීමේ පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(v) අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්පත් යොමුකරන තනතුර, ගැසට් නිවේදනයේ සඳහන් පරිදි පැහැදිලිව සටහන් කළ යුතුය. අසම්පූර්ණ හා 04 ඡේදයේ 1 යටතේ සඳහන් සහතිකවල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vi) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එන්. ඩී. අයි. ස්වර්ණා කේ. පෙරේරා,
ලේකම්,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2014 ජූලි මස 16 වැනි දින,
පානදුර පාර,
බණ්ඩාරගම,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව**

.......................................... තනතුර සඳහා අයදුම්පත්‍රය

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :————————————.
02. (මුලකුරු වලින් හැඳින්වෙන නම්) :————————————.
03. ස්ථිර ලිපිනය :————————————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :————————————.
05. උපන් දිනය ඃ වර්ෂය:————————————.මාසය:————————————. දිනය:————————————.
06. අයදුම්පත් භාර ගන්නා 2014.08.15 දිනට වයස ඃ අවු :————————————.මාස:————————————. දින:————————————.

07. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
08. විවාහක/අවිවාහක බව:——————————.:——————————.
09. ජාතිය:——————————.:——————————.
10. ඔබ දැනටමත් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්:——————————.
දරන තනතුර ————— සේවා කාලය————— එම පත්වීම ස්ථිර ද/තාවකාලික ද/අනියම් ද/කොන්ත්‍රාත් ද යන වග :——————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද?, ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————.
12. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු ය.):——————————.
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන.............................................................................................. මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ/(ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්) පදනම මත ........................................ දින සිට ........................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය අයදුම් කරන තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශකර ඉදිරිපත් කරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :——————————.
තනතුර :——————————.
දෙපාර්තමේන්තුව :——————————.
නිල මුද්‍රාව:——————————.
දිනය :——————————.

08-199

---

### අකුරණ ප්‍රාදේශීය සභාව

අකුරණ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවත්නා තනතුරු වෙනුවෙන් බඳවා ගැනීම සඳහා 2014.07.18 දින අංක 1872 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි කොටසේ පළ කරන ලද නිවේදනයේ 05(1) ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරමි :-

05. *ඉල්ලුම්පත්‍ර එවිය යුතු පිළිවෙල*

(1) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයට අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත් 2014.08.22 දිනට පෙර “ලේකම්, අකුරණ ප්‍රාදේශීය සභාව, අලවතුගොඩ” යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ටී. එස්. රාජපක්ෂ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව.

2014 ජූලි 21 වැනි දින,
අලවතුගොඩ,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

08-262

---

# පළාත් පාලන නිවේදන

### කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) (අ) වගන්තිය ප්‍රකාරව 2014.03.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසෙහි ප්‍රකාශයට පත් කරන ලද පහත සඳහන් උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩී. එම්. උපාලි දිසානායක,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

2014 ජූලි මස 10 වැනි දින,
බුළුරුප්ප, හෙට්ටිමුල්ල,
කෑගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01. | පාරේ නම | - | සියඹලාපිටියේ සිට දික්හේනට යන පාර |
| | වසම | - | සියඹලාපිටිය |
| | දිග | - | අඩි 708 |
| | පළල | - | අඩි 8 |

| පාරේ වම්පස | | | පාරේ දකුණුපස | | |
|---|---|---|---|---|---|
| 1. | නිමල් ජයසිංහ | උඩම්බේ කුඹුර | 1. | නිමල් ජයසිංහ | උඩම්බේ කුඹුර |
| 2. | එම්. කරුණාරත්න | උඩම්බේ වත්ත | 2. | ආර්. පී. දයාරත්න | පන්සල්වත්ත |
| 3. | එම්. ජයසූරිය | උඩම්බේ වත්ත | 3. | සියදෝරිස් | ලොට් අංකය 203 |
| 4. | එම්. අමරසූරිය | ලොට් අංකය 204 | 4. | සියදෝරිස් | ලොට් අංකය 203 |
| 5. | එච්. ඩිංගිරි මැණිකේ | ලොට් අංකය 201 | 5. | එච්. ගුණසිරි | ලොට් අංකය 86 |



| | | | |
|---|---|---|---|
| 02. | පාරේ නම | - | උනුමුව සිට මල්ගම්මන එගොඩ කොටස දක්වා මාර්ගය |
| | වසම | - | ගුරුල්ලවල |
| | දිග | - | මීටර් 108.5 |
| | පළල | - | අඩි 08 |

පාරේ වම්පස

| | | |
|---|---|---|
| 1. | ඇස්වැද්දුම කුඹුර | |
| 2. | කේ. ආර්. රම්බණ්ඩා | උනුමුව ගොඩිගමුව, මොරොන්තොට |
| 3. | කේ. ඩී. කිරිමැණිකා | ශාන්ති සෙවන, මල්ගම්මන, මොරොන්තොට |
| 4. | ඩබ්. සෝමසිරි | හාල්මැස්ස, එගොඩ |

පාරේ දකුණුපස

| | | |
|---|---|---|
| 1. | කේ. ආර්. රම්බණ්ඩා | උනුමුව, ගොඩිගමුව මොරොන්තොට. |
| 2. | ඩී. පී. සමන්ත සම්පත් | හාල්මැස්ස, එගොඩ මොරොන්තොට |
| 3. | කේ. ඩී. කිරිමැණිකා | ශාන්ති සෙවන, මල්ගම්මන, මොරොන්තොට. |

02. උනුමුව සිට මල්ගම්මන එගොඩ කොටස දක්වා මාර්ගය



| | | | |
|---|---|---|---|
| 03. | පාරේ නම | - | වේරකේවත්ත පාර |
| | වසම | - | අඹන්පිටිය |
| | දිග | - | අඩි 302 |
| | පළල | - | අඩි 8 |

*පාරේ වම්පස*

1. කේ. පී. කිරිනේරිස් — වේරකේවත්ත
2. කේ. පී. අමරා පද්මකාන්ති — වේරකේවත්ත
3. එන්. සුගත් චමින්දකුමාර — වේරකේවත්ත
4. ආර්. ඩී. විමලාවතී — වේරකේවත්ත

*පාරේ දකුණුපස*

1. එච්. එමලින් — වේරකේවත්ත
2. එන්. මහින්ද නිශ්ශංක — වේරකේවත්ත
3. චිත්‍රා දමයන්ති — වේරකේවත්ත
4. අමරා නිල්මිණී — වේරකේවත්ත
5. එන්. හේමචන්ද්‍ර — වේරකේවත්ත



04. පාරේ නම - උඳුගොඩ මීදණ්ඩවත්ත දක්වා මාර්ගය
වසම - උඳුගොඩ
දිග - අඩි 928
පළල - අඩි 8

| පාරේ වම්පස | | පාරේ දකුණු පස | |
|---|---|---|---|
| 1. ඊ. ඒ. චමින්ද ඒකනායක | උඳුගොඩ නගරය, උඳුගොඩ | 1. ඊ. ඒ. සුදත් ඒකනායක | උඳුගොඩ,සිනමාහල්වත්ත |
| 2. එම්. වී. කරුණාරත්න | මීදණ්ඩවත්ත, උඳුගොඩ | 2. එල්. ආර්. පී. බණ්ඩාර | මීදණ්ඩවත්ත, උඳුගොඩ |
| 3. ඊ. ඒ. සුමනාවතී | උඳුගොඩ නගරය, උඳුගොඩ | 3. ඊ. ඒ. එච්. සී. ඒකනායක | මීදණ්ඩවත්ත, උඳුගොඩ |
| 4. ඊ. ඒ. ශාන්ත ඒකනායක | මීදණ්ඩවත්ත, උඳුගොඩ | 4. ඊ. ඒ. රසික කුමාර | මීදණ්ඩවත්ත, උඳුගොඩ |
| 5. ඊ. ඒ. සමන්ත බන්දුල ඒකනායක | මීදණ්ඩවත්ත, උඳුගොඩ | | |

04. උඳුගොඩ මීදණ්ඩවත්ත දක්වා මාර්ගය



| | | | |
|---|---|---|---|
| 05. | පාරේ නම | - | දික්ඇල්ල වත්ත පාර |
| | වසම | - | දික්ඇල්ල |
| | දිග | - | අඩි 150 |
| | පළල | - | අඩි 10 |

**පාරේ වම්පස**

| | | |
|---|---|---|
| 1. | එම්. පී ටී. මාරසිංහ | අංක 152/6 |
| 2. | පී. එච්. ආර්. විජේසේන | අංක 152/3 |

**පාරේ දකුණු පස**

| | | |
|---|---|---|
| 1. | එච්. ආර්. නන්දසේන | අංක 152/8 |
| 2. | ජී. ජී. ගයනි ලක්මාලි | අංක 152/4 |
| 3. | එච්. ජී. ජයසූරිය | අංක 152/10 |
| 4. | පී, එච්. ආර්. පියසේන | අංක 152/2 |

05. දික්ඇල්ල වත්ත පාර



## ඇල්ල ප්‍රාදේශීය සභාව

ඇල්ල පොදු ක්‍රීඩාංගනය වෛද්‍ය රෝහන පුෂ්පකුමාර ක්‍රීඩාංගනය ලෙස නම් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ඇල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව 2014 අප්‍රේල් මස 29 දින පැවති මාසික රැස්වීමේ දී ඇල්ල ප්‍රාදේශීය සභාවට අයත් ඇල්ල පොදු ක්‍රීඩාංගනය "වෛද්‍ය රෝහන පුෂ්පකුමාර ක්‍රීඩාංගනය" ලෙස නම් කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. සුනිල් ගාමිණී,
සභාපති,
ඇල්ල ප්‍රාදේශීය සභාව.

08-30

---

## රත්නපුර මහ නගර සභාව

2014 වසර සඳහා ලැගුම්හල් සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

රත්නපුර මහා නගර සභාව විසින් 2014 වර්ෂයේ පෙබරවාරි මස 10 වැනි පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 06 (1) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ රත්නපුර මහා නගර සභා බල ප්‍රදේශය තුළ කිසියම් ලැගුම්හලක් හෝ නවාතැන්පලක් පවත්වාගෙන යාම සඳහා 2014 වර්ෂයේ දී රත්නපුර මහා නගර සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මත ම ගාස්තුවක් අයකරනු ලබන බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

වී. කේ. ඩබ්. අබේරත්න,
නගරාධිපති,
රත්නපුර මහා නගර සභාව.

2014 පෙබරවාරි මස 20 වැනි දින,
රත්නපුර මහා නගර සභාව,
රත්නපුර.

### යෝජනාව

මහා නගර සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ රත්නපුර මහා නගර සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවන් යටතේ රත්නපුර මහා නගර සභාව විසින් 2014 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 252 වැනි අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 247(අ) වැනි වගන්තියෙන් මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව ලැගුම්හලක් හෝ නවාතැන්පලක් පවත්වාගෙන යාම වෙනුවෙන් ඒ ලැගුම්හල හෝ නවාතැන්පල සඳහා පවත්වාගෙන යාමට යෙදුණු පසුගිය වර්ෂයේ ලැබීම් වලින් 1%ක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට රත්නපුර මහා නගර සභාව ෆයජනා කරන්නීය.

08-125

---

# අතුරු ව්‍යවස්ථා

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් 2013.08.28 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2014 ජූනි මස 11 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

### යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 සිට 126 දක්වා වූ වගන්ති වලින් 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඌව පළාත් සභාවේ විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඌව පළාතේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013 ජනවාරි මස 22 වැනි දින අංක 1794/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ IV(අ) වැනි පළාත් සභා කොටසේ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රජා මූල සංවිධාන විසින් කළමනාකරණය කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම අතුරු ව්‍යවස්ථා අංක 01 සිට 25 දක්වා වූ කොටස්වල දැක්වෙන සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වැල්ලවාය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

08-126/2

**වැල්ලවාය ප්‍රාදේශීය සභාව**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් 2013.10.31 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2014 ජුනි මස 11 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

**යෝජනාව**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 සිට 126 දක්වා වූ වගන්ති වලින් 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඌව පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඌව පළාතේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* IV(අ) වැනි පළාත් සභා කොටසේ පළකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ ප්‍රාදේශීය සභාවල සම්මත අතුරු ව්‍යවස්ථා අංක 01 සිට 25 දක්වා වූ කොටස්වල දැක්වෙන සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වැල්ලවාය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

08-126/1

---

**පානදුර ප්‍රාදේශීය සභාව**

*2005.02.18 දිනැති අංක 1,381 දරන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත*

*ගැසට් පත්‍රයේ* පළාත් සභා නිවේදන යටතේ 1,952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතට අනුව පළකරන ලද පුස්තකාල සම්මත අතුරු ව්‍යවස්ථාව පානදුර ප්‍රාදේශීය සභාව වැළඳගන්නා බව මින් නිවේදනය කරමි.

සභාපති,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

**ප්‍රාදේශීය සභාවන්හි මහජන පුස්තකාල සඳහා වූ අතුරු ව්‍යවස්ථාව**

01. *අරමුණ*.- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන පුද්ගලයන්ගේ සහ සමාජ කණ්ඩායම්වල අධ්‍යාපනික, තොරතුරු සහ පුද්ගල සංවර්ධනය මෙන් ම නිර්මාණාත්මක සහ විනෝදාත්මක අවශ්‍යතා සපුරාලීමට විවිධ වූ මාධ්‍ය වලින් සමන්විත සම්පත් හා සේවා සැපයීම සඳහා ප්‍රාදේශීය සභාවක් විසින් මහජන පුස්තකාල සේවාවන් ආරම්භ කර පවත්වාගෙන යනු ලබන අතර, ඊට අදාළ විධිවිධාන සැලැස්වීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

02. ප්‍රාදේශීය සභාවක මහජන පුස්තකාලය ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා පරිදි පහත සඳහන් අංශ හා සේවා වලින් සමන්විත විය හැකි ය.

1. බැහැර දෙන අංශය
2. විමර්ශන අංශය
3. ළමා අංශය
4. වාර සඟරා අංශය හා පුවත්පත් අංශය
5. ශ්‍රව්‍ය දෘෂ්‍ය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය
6. අධ්‍යයන අංශය
7. ග්‍රන්ථ සංරක්ෂණ අංශය
8. දුර්ලභ ග්‍රන්ථ අංශය
9. විශේෂිත එකතු හා ප්‍රාදේශීය එකතු
10. විඥාපන හා ප්‍රලේඛන සේවා අංශය
11. ආබාධිත රෝහල් හා බන්ධනාගාර ප්‍රජාව සඳහා පුස්තකාල සේවා
12. ඡායා පිටපත් සේවා
13. ප්‍රජා තොරතුරු සේවා
14. විස්තාරණීය සේවා (ජංගම හා ශාඛා පුස්තකාල ප්‍රදර්ශන, චිත්‍රපටි දර්ශන, දේශන ආදිය)
15. වෙනත් තොරතුරු සේවා

03. ප්‍රාදේශීය සභාවේ සෑම මහජන පුස්තකාලයක් සඳහාම පුස්තකාලයාධිපතිවරයෙකු සිටිය යුතු අතර, එසේ පත් කරනු ලබන තැනැත්තා මහජන පුස්තකාලයේ සංවිධානය හා කළමණාකාරීත්වය විධිමත්ව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට වගකිය යුතු වන්නේ ය.

04. මහජන පුස්තකාල සේවාවට උපදේශකත්වය හා මඟ පෙන්වීම සඳහා මෙහි මින්මතු 'කමිටුව' නමින් හඳුන්වනු ලබන පුස්තකාල උපදේශක කමිටුවක් පත් කල යුතු ය.

(i) මෙම කමිටුව ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව පත් කරනු ලැබේ. එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

*(අ)* සභාපතිවරයා
*(ආ)* සභාවේ සභිකයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන තුන් දෙනෙකුට නොඅඩු සාමාජිකයින් සංඛ්‍යාවක්, (සභාවේ අභිමතය පරිදි මෙම සංඛ්‍යාව තීරණය කළ හැකි ය.)
*(ඇ)* සභාබල ප්‍රදේශයේ පදිංචි ජනතාව අදහන ආගම් නියෝජනය වන ආකාරයට එක් එක් ආගම වෙනුවෙන් එක් නියෝජිතයකු බැගින්,
*(ඈ)* ප්‍රදේශයේ ජීවත් වන ප්‍රභූන් 04 දෙනෙක්,
*(ඉ)* ප්‍රාදේශීය සභාවේ ලේකම්,
*(ඊ)* ප්‍රජා සංවර්ධන නිලධාරී,
*(උ)* ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන පුස්තකාලයේ පුස්තකාලයාධිපති,
*(ඌ)* බල ප්‍රදේශයේ ප්‍රජාමණ්ඩලයක නියෝජිතයෙක්,
(එ) බල ප්‍රදේශයේ විදුහලක විදුහල්පතිවරයෙක්,

(ii) කමිටුවේ සාමාජික සංඛ්‍යාව 19ට නොවැඩි විය යුතු ය.

(iii) සභාපතිවරයා නිල බලයෙන් කමිටුවේ සභාපතිවරයා විය යුතු අතර, එහි සෑම රැස්වීමකම මූලාසනය ඔහු දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට පැමිණ සිටින සාමාජිකයන් අතුරෙන් තෝරා පත් කර ගනු ලබන තැනැත්තෙකු එම රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(iv) ප්‍රාදේශීය සභාවේ ලේකම් කමිටුවේ කැඳවුම්කරු විය යුතු ය.

(v) ප්‍රාදේශීය සභා ප්‍රධාන පුස්තකාලයේ පුස්තකාලයාධිපතිවරයා කමිටුවේ ලේකම් විය යුතු ය.

05. *ගණ පූරණය.-*

*(අ)* ගණපූරණය කමිටු සාමාජික සංඛ්‍යාවෙන් 1/3 ක් විය යුතු ය.
*(ආ)* කවර හෝ රැස්වීමක මූලාසනය දරන සාමාජිකයාට එක් මූලික ඡන්දයක් ද යම් ප්‍රශ්ණයක් සම්බන්ධයෙන් පක්ෂව හා විපක්ෂව ඡන්ද සංඛ්‍යාව සමාන වූවොත් තීරක ඡන්දයක් ද ඇත්තේ ය.

06. *සාමාජිකත්වය.-*

(I) පුස්තකාල සාමාජිකත්වය ලැබීම සඳහා පහත සඳහන් සුදුසුකම් තිබිය යුතු ය.

(i) සාමාන්‍ය සාමාජිකත්වය ලබා ගැනීම සඳහා වයස අවුරුදු 12ට වැඩි වීම, ළමා සාමාජිකත්වය සඳහා වයස අවුරුදු 12ට අඩු වීම, සහ

(ii) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පදිංචිකරුවෙකු හෝ අධ්‍යාපනය ලබන්නෙකු හෝ දේපළ හිමියකු හෝ රැකියාව කරන්නෙකු හෝ වීම.

(II) *සාමාජික ගාස්තු.-*

(i) වාර්ෂික සාමාජික ගාස්තුව රු. 50 කි. වසර දෙකකට වරක් රු. 30ක් ගෙවා සාමාජිකත්වය අළුත් කරවා ගත යුතු ය. ළමා සාමාජිකයන් සඳහා ගාස්තුව ඉන් අඩකි. එසේ වුව ද, සාමාජික ගාස්තුව කමිටුවේ නිර්දේශය පරිදි සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

(III) *ඇපකරුවන්.-*

(i) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වරිපනම් බදු ගෙවන්නෙකු ඇපකරුවකු වශයෙන් ඉදිරිපත් කළ යුතු ය.

(ii) ළමා පාඨකයන් සහ පාසල් සිසුන් සඳහා ඔවුන්ගේ මව/පියා/භාරකරු/විදුහල්පති/පංතිභාර ගුරුවරයා සාමාජික අයදුම්පත සහතික කළ යුතු අතර, ඇපකරු ප්‍රදේශයේ වරිපනම් බදු ගෙවන්නෙකු විය යුතු ය.

(iii) I හා II අදාළ නොවන අයදුම්කරුවන් හට ඇපකරුවන් වශයෙන් වාර්ෂික වැටුප රු. 69,480 ක් ලබන රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරියකු අත්සන් කළ යුතු ය.

*IV. සාමාජිකත්වය ලබා ගැනීම.-*

*(i)* පුස්තකාල සේවාවන් අපේක්ෂාකරන සෑම තැනැත්තෙකුම සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියක් මගින් නියම කරනු ලබන ගාස්තුවක් ගෙවා පුස්තකාලයාධිපති වෙතින් ලබා ගන්නා අයදුම්පතක් මගින් සාමාජිකත්වය ඉල්ලුම් කළ යුතු අතර, එම අයදුම්පත්‍රය මෙහි පහත සඳහන් තැනැත්තෙකු ලවා සහතික කරවා ගත යුතු ය.

(1) පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි,
(2) ආගමික පූජකවරයෙක්,
(3) සාමදාන විනිශ්චයකාරවරයෙක්,
(4) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු,
(5) ප්‍රාදේශීය සභාවේ සභිකයෙක්,
(6) පාසල් අයදුම්කරුවෙකු නම් එම අයදුම්කරුගේ පංති භාර ගුරුවරයා/විදුහල්පතිවරයාගේ සහතිකය.

*(ii)* සෑම සාමාජිකයකුටම නිකුත් කළ යුතු බලපත්‍ර සංඛ්‍යාව සභාව විසින් පුස්තකාල උපදේශක කමිටුවේ නිර්දේශය මත කලින් කළ යෝජනා සම්මුතියක් මගින් තීරණය කළ යුතු ය.

07. බැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයෙකුට නිකුත් කරන ලද බලපත්‍රයක් මත සාමාජිකයා විසින් රැගෙන යන ලද සෑම පොතක් සඳහා ඔහු වගකිව යුතු ය. සෑම සාමාජිකයෙකුටම නිකුත් කළ යුතු බලපත්‍ර සංඛ්‍යාව පුස්තකාල උපදේශක කමිටුවේ නිර්දේශය මත සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියකින් තීරණය කළ යුතු යි.

08. බැහැර දෙන පුස්තකාල සාමාජිකයකු විසින් පුස්තකාලයෙන් ලබා ගන්නා පොතක්, එය ලබාගන්නා ලද දින සිට දින දාහතරක (14) කාලයක් ඇතුළත පුස්තකාලයාධිපතිවරයාට ආපසු භාරදිය යුතු යි. එවැනි යම් පොතක් වෙනත් සාමාජිකයකු විසින් ඉල්ලා නොමැති නම්, ඒ පොත වැඩිදුර දින දාහතරක් සඳහා ලබා ගැනීමට පුස්තකාලයාධිපති විසින් ඒ සාමාජිකයාට අවසර දෙනු ලැබිය හැකි ය.

09. 08 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දින දාහතරක කාලසීමාව ඇතුළත යම් පොතක් පුස්තකාලයාධිපතිවරයාට ආපසු භාරදීම සාමාජිකයෙකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඒ පොත ආපසු භාරදිය යුතු දිනය ඉක්මවා යන එක් එක් දිනයක් වෙනුවෙන් රු. 1 බැගින් හා ළමා පාඨකයින් සඳහා ශත 50 බැගින් වන දඩ මුදලක් හෝ කමිටුවේ නිර්දේශ මත සභාව විසින් කළින් කළ යෝජනා සම්මුතියක් මගින් නියම කර ගනු ලබන යම් මුදලක් දඩ වශයෙන් ගෙවීමට යටත් වන්නේ ය.

10. බැහැර දෙන පුස්තකාලයෙන් තමා විසින් ලබාගන්නා ලද පොතක් 08 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දවස් දාහතරක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව පහත දැක්වෙන අයුරින් දඩ මුදල් අයකරනු ලැබේ.

දින 01 සිට දින 30 දක්වා එක් පොතකට රු. 1. 00 බැගින්,
දින 31 සිට දින 90 දක්වා එක් පොතකට රු. 40. 00 බැගින්,
දින 91 සිට දින 180 දක්වා එක් පොතකට රු. 80.00 බැගින්,
දින 180කට වැඩි දින සඳහා එක පොතකට රු. 100.00 බැගින්.

එසේ වුව ද, ළමා පාඨකයෙක් වන අවස්ථාවක අයකළ යුතු වන්නේ 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රමාද ගාස්තු වලින් අඩකි.

11. පොතක් නැතිවූයේ යැයි සැළකෙන අවස්ථාවක එම පොතේ වටිනාකම, බැඳුම් ගාස්තු සහ එම පොත ආපසු සපයා ගැනීමේ වියදම සහ 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දඩ මුදල් අදාල සාමාජිකයා විසින් දැරිය යුතු ය. මෙහි දී සම්මත ක්‍රම සහ උපදේශක කමිටු නිර්දේශ පදනම් කර ගනිමින් අය විය යුතු ගාස්තු පුස්තකාලයාධිපතිවරයා විසින් තීරණය කළ යුතු ය.

12. සාමාජිකයකු විසින් පුස්තකාලයෙන් ලබාගත් පොතකට හානි කිරීම හෝ කවර හෝ ආකාරයකින් එය විරූපී කිරීම නොකළ යුතු ය.

13. බැහැර දෙන පුස්තකාලයෙන් ලබාගත් පොතකට සිදු වී ඇති හානි වීමක් පිළිබඳව දැනගත් වහාම පුස්තකාලයාධිපතිවරයාට දැනුම් දීම සෑම සාමාජිකයෙකු විසින් ම කළ යුතු ය. එවැනි හානියක් හෝ විරූපි වීමක් පිළිබඳව පුස්තකාලයාධිපතිවරයාට දැනුම් දීම යම් සාමාජිකයකු විසින් පැහැර හැර ඇති අවස්ථාවක ඒ පොත එම සාමාජිකයාට හානියක් හෝ විරූප කිරීමකින් තොරව නිකුත් කරන ලද සේ සළකනු ලැබේ.

14. සාමාජිකයකු විසින් ආපසු භාර දෙන ලද පොතක් තවදුරටත් නිකුත් කිරීමට නුසුදුසු වන තරමට ඔහු විසින් හානි කර හෝ විරූප කර ඇති බවට පුස්තකාලයාධිපතිවරයා විසින් සෑහීමකට පත් වන්නා වූ අවස්ථාවක ඒ පොත නැවත සපයා ගැනීමේ වර්තමාන වියදම දැරීමට ඒ සාමාජිකයා බැඳී සිටින්නේ ය. ඒ පොත නැවත සපයා ගැනීමෙන් පසුව හානි වූ පොත "මහජන පුස්තකාලය හානි වූ පොතක් ලෙස විකුණන ලදී" යනුවෙන් මුද්‍රා තබා ඒ සාමාජිකයාට ආපසු දිය යුතු ය. එසේ සපයා ගනු ලැබූ පොතට, නැති වූ පොතෙහි අදාල පරිග්‍රහණ අංකය යෙදිය යුතු ය. එසේ සැපයීමට අපොහොසත් වුවහොත් එය නැති වූ පොතක් සේ සලකා ඉහත 11 වන අතුරු ව්‍යවස්ථාවේ පරිදි කටයුතු කළ යුතු ය.

15. (i) පුස්තකාලයෙන් ලබාගත් පොතක් කිසිම සාමාජිකයකු විසින් අන්සතු කිරීමක් නොකළ යුතු ය.

(ii) මේ අතුරු ව්‍යවස්ථාවේ පළමුවන ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන කවර හෝ සාමාජිකයකුගේ සාමාජික මුදල අහිමි වන අතර බැහැර දෙන පුස්තකාලයේ ඔහුගේ සමස්ත සාමාජිකත්වය ද අහෝසි වන්නේ ය.

16. (i) ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකු විසින් පාවිච්චි කළ බව තමා දන්නා කිසිම පොතක් කිසියම් සාමාජිකයෙකු විසින් බැහැර දෙන පුස්තකාලයට ආපසු භාර දිය නොදිය යුතු අතර, ඒ පිළිබඳව වහාම පුස්තකාලාධිපතිට දැනුම් දී පුස්තකාලාධිපති විසින් දෙනු ලබන උපදෙස් හා නියමයන් පරිදි අදාළ සාමාජිකයා විසින් ඒ පොත සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ය.

(ii) පුස්තකාලයෙන් සාමාජිකයෙකු විසින් ලබාගන්නා ලද පොතක් ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන තැනැත්තෙකු විසින් පාවිච්චිකර ඇති විට ඒ පොත විනාශ කළ යුතු අතර, එය නැවත සපයා ගැනීමේ වියදම ඒ සාමාජිකයා පුස්තකාලාධිපතිවරයාට ගෙවිය යුතු ය.

17. කිසියම් පොතක් ලබාදිය යුත්තේ කවර සාමාජිකයාට ද යන්න පිළිබඳව මත භේදයක් බැහැර දෙන පුස්තකාලයක සාමාජිකයන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් අතර උද්ගත වූ විටෙක ඒ මතභේදය පුස්තකාලයාධිපතිවරයා විසින් විසඳිය යුතු ය.

18. බැහැර දෙනු ලබන පුස්තකාලයේ ඇති පොතක් හෝ පුස්තකාල ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් කිසියම් සාමාජිකයකු විසින් ඉල්ලා සිටි විටෙක එය නිකුත් කළ යුතු අතර ඒ වන විටත් එකී පොත නිකුත් කර තිබුණේ වී නම් ඉල්ලුම්කරුගේ හෝ ඉල්ලුම්කරුවන්ගේ නම් පොරොත්තු ලේඛනයක සටහන් කරගෙන පුස්තකාල ද්‍රව්‍ය පුස්තකාලයට ලැබුණු පසු ඒ ඒ තැනැත්තාට ලබා දීමට පුස්තකාලයාධිපතිවරයා ක්‍රියාකළ යුතු ය.

19. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රමිතීන් අනුව, නියමිත දිනයන් හා පැය ගණන පාඨකයන් සඳහා පුස්තකාලය විවෘතව තැබීම කළ යුතු ය. එහෙත් විශේෂ හේතුවක් මත සභාවේ අභිමතය පරිදි පුස්තකාලය විවෘතව තබන දිනයන් හා වේලාවන් තීරණය කළ හැකි ය.

20. *විමර්ශන අංශය.*-

(i) පුස්තකාලයාධිපතිවරයාගේ අවසරය ඇතිව විමර්ශන අංශයේ තබා ඇති ලේඛනයේ අත්සන් තබා විමර්ශන ග්‍රන්ථ පරිශීලනය කළ යුතු ය.

